# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,486 — 1965 අගෝස්තු 20 වැනි සිකුරාදා — 1965.8.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දන්වීම් ... ... | 101 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දන්වීම් ... ... ... | — | බුදල් නඩු පිළිබඳ දන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දන්වීම් ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දන්වීම් ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දන්වීම් ... ... | — | විවිධ දන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත්කිරීම් ... ... | — | | |


## පිස්කල් විකිණීම් පිළිබඳ දන්වීම්

### මධ්‍යම පළාත

මාවතගම වටරැක පල්ලෙ ඉඟුරුවත්තේ පදිංචි ඊ. ඇම්. පුංචි බණ්ඩා ........................................................ පැමිණිලිකාරයා.

නොම්මරය ඇම්. ඇස්. 5,798 එදිරිව

පිලිමතලාවේ බෝඅංගේ වලව්වේ පදිංචි ඇම්. බී. බෝඅංගෙ ........................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ පහත සඳහන් දේපල වලට ඉහත සඳහන් විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්‍ෂ 1965 ක්වූ සැප්තැම්බර් මස 14 දින උදේ 11 පැයට එකී ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. රුපියල් 1,241/98 ක් හා අනෙකුත් මුදල් ඇතුලු (විත්තිකරු විසින් ගෙවා ඇති මුදල් හැර) පවුන්ඩේජ් මුදල් ආදිය අයකර ගැනීම සඳහායි. එනම්:—

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර මැද පලාත අරඹේගම පිහිටා තිබෙන ඉත්තලව්වේ වත්ත අක්කර හතයි, රූඩ් තුනයි, පර්චස් විසිපහක වපසරිය ඇති ඉඩමට මායිම්: උතුරට සහ බස්නාහිරට: ගිරුගම වත්තට යන පාර; නැගෙනහිරට: පන්සලේ වත්ත; දකුණු නැගෙනහිරට: කොළපාගන කමත, උඩබෝඅන්ගේ කුඹුර, ඇම්. බී. .බෝඅන්ගේ උරුමකම් කියන උඩහ බෝඅන්ගේ කුඹුර සහ පල්ලෙහා වත්ත නොහොත් ඉත්තලාව; දකුණු බස්නාහිරට: ඉත්තලාවද වේ. මෙකී ඉඩම තුල පිහිටා තිබෙන ගහකොළ ගොඩනැගිලි පලතුරු ආදී සෑම සියලු දේත් සමගවේ.

ර. මු. ජ. රත්නායක,
ම. ප. පිස්කල් වෙනුවට.

1965 අගෝස්තු මස 14 වැනි දින,
මහනුවර පිස්කල් කාර්‍යාලයේ දීය.

8-737

## විශෙෂ නිවේදනයයි

1965 සැප්තැම්බර් 10 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1965 සැප්තැම්බර් 9 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1965 සැප්තැම්බර් 4 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1965 අගෝස්තු 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.


101—ආර් 61466—1,754 (65/8)

## වයඹ පළාත

### කුරුණෑගල දිස්ත්‍රික් තඩුශාලාවේදීය

හොරොම්බාවේ පදිංචි නෙත්තිසිංහ අප්පුහාමිලාගේ හෙන්රි පෙරේරා නෙත්තිසිංහ.................................... පැමිණිලිකාරයා.

නොම්මරය 1347/ඇම්බී එදිරිව

මඩව කඳුබොඩ පදිංචි බෝදිපක්ෂගේ විලියම් මඩව......විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහතකී තඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1965 ක්වූ සැප්තැම්බර් මස 13 දින අපරභාග 3 ට 1 වෙනි ඉඩමේ සිට පිළිවෙලින් ප්‍රසිඩ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

විත්තිකරු විසින් 1963 ක්වූ සැප්තැම්බර් මස 17 වෙනි දින පී. ඩබ්ලිව්. ආර්. පතිරාජ ප්‍රසිඩ නොතාරිස් තැන විසින් සහතික කළ අංක 40687 දරණ උගස් ඔප්පුව පිට තඩු පවරා 1964 ක්වූ ඔක්තෝබර් මස 16 වෙනි දින ලබාගත් තඩු තීන්දුව පිට අයකර ගැනීමට නියම කළ මුදල රු. 1,000 ක්ද 1963 සැප්තැම්බර් මස 16 වෙනි දින සිට ගෙවා නිදහස්වන තුරු නීති පොලියද, තඩු වියදම රු. 371.92 ක්ද පිස්කල් ගාස්තු ආදියද අයකර ගැනීමටය.

1. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ ගන්දහයේ කෝරලේ මඩව තාරාපොත පිහිටි වී පහලොස් ලහක වපසරිය ඇති දංගහ කුඹුරට මායිම්:—උතුරට: පූලාගේ කුඹුරේ නියරද; නැගෙනහිරට: කලුගේ කුඹුරේ වැටද; දකුණට: කලුවාගේ කුඹුරද; බස්නාහිරට: කිරිඋංගාදුරයාගේ කුඹුරේ නියරද යන මෙකී මායිම් තුළ පිහිටි කුඹුරෙන් නොබෙදූ දෙකෙන් කොටසක් සහ එහි තුළ තිබෙන සෑම දෙයිනුත් සමාන කොටසක්ය. ලියා පදිංචි කළ අංකය: ඒ.613/228.

2. ඉහතකී කෝරලේ මඩව කඳුබොඩ පිහිටි කුරක්කන් ලාහක වපසරිය ඇති පිනීගේවත්තේහේන දැනට වත්ත නැමැති ඉඩමට මායිම්:—උතුරට: පිංචාගේ වත්තේ වැටද; නැගෙනහිරට සහ බස්නාහිරට: කිරාගේ වත්ත සහ හේනද; දකුණට: ඩිංගිත්තීගේ සහ තවත් අයට අයිති වත්තද යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම සහ එහි තුළ සෑම දේත්ය. ලියා පදිංචි කළ අංකය: ඒ. 141/100.

ඒ. බී. රාජනායක,
ව. ප. පිස්කල් වෙනුවට.

වර්ෂ 1965 ක්වූ අගෝස්තු මස 13 වෙනි දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේදීය.

8-730

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි